GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/05/24

මාධ්‍ය නිවේදනයයි

හෙද වින්නඹු අවුල සමථයකට

හෙදියන්ට වින්නඹු සේවාව ලබාදීම සඳහා පාදක වූයේ වින්නඹු මාතාවන් 3000ක් හිඟ බව කරන ලද අර්ථ දැක්වීමයි. හෙද පරිපාලනය විසින් හිතා මතා ඇති කරන ලද මෙම අසතුටුදායක තත්ත්වය නිරාකරණය වී ඇත.

සෞඛ්‍ය ඇමතිතුමා විසින් දුන් නියෝගයකට අනුව වින්නඹු මාතාවන් සඳහා අයදුම්පත් කැඳවීම නිසා වින්නඹු මාතාවන් 1500ක් පුහුණු කිරීම ඇරඹීමට හැකිවී ඇත. ප්‍රසව හා නාරීවේද විශේෂඥ වෛද්‍යවරුන් ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුව වින්නඹු පුහුණුව ලබා දීමට සෘජුවම සම්බන්ධ වී ඇත. එබැවින් වින්නඹු පුහුණුවට අකුල් හෙලීමට හෙද පරිපාලනයට නොහැකි වනු ඇත.

එමෙන්ම, තව මාස කිහිපයකින් මෙවැනිම වින්නඹු සියුන් 1500ක පුහුණුවක් ආරම්භ වනු ඇත. මේ අනුව වින්නඹු හිඟය නිසා ඇති වූ අනවශ්‍ය ප්‍රශ්නත් ව්‍යාකූල තත්ත්වයත් විසඳෙනු ඇත.

මෙතැන් සිට වින්නඹු මාතා පුහුණුව ප්‍රසව හා නාරීවේද විශේෂඥ වෛද්‍යවරුන්ගේ සෘජු අධීක්ෂණයට අනුව සිදු කරන අතර ඉන් මාතෘ සේවාව ගුණාත්මකව දියුණු වනු ඇත. 2015 දී වින්නඹු හිඟය නිම වනු ඇත.

ස්තුතියි

වෛද්‍ය සමන් අබේවර්ධන
ලේකම්

වැඩිදුර විස්තර සඳහා :
වෛද්‍ය නවින් සොයිසා - 0718582444
වෛද්‍ය නලින්ද හේරත් - 0717876516